# පුරප්පාඩු

# ශ්‍රී ලංකා වෛද්‍ය සභාව

# පරිපාලන නිලධාරී තනතුර

ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පවතින පරිපාලන නිලධාරී තනතුර පිරවීම සඳහා සුදුසුකම් සහිත අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**පරිපාලන නිලධාරී - JM-1-1"කනිෂ්ඨ කළමනාකරු" සේවා ගණය - තනතුරු 01යි.**

**අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද:**

අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් රාජ්‍ය පරිපාලන, රාජ්‍ය කළමනාකරණ මානව සම්පත් කළමනාකරණ, ව්‍යාපාර පරිපාලන, ව්‍යාපාර කළමනාකරණ යන ඕනෑම ක්ෂේත්‍රයකින් පළවූ උපාධියක් ලබා තිබීම.

ආ) පළමු උපාධිය ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් වසර 03ක කළමනාකරණ තලයේ රැකියාවක පළපුරුද්ද හෝ පසුගිය වසර 03ක කාලයක පරිපාලන ක්ෂේත්‍රයේ හෝ මානව සම්පත් කළමනාකරණ ක්ෂේත්‍රයේ පරිපාලන ආයතනයක සාමාජිකත්වය ලබා තිබීම.

ඇ) පරිගණක සාක්ෂරතාව හා ERP පද්ධති පිළිබඳ ඉහළ දැනුම, කම්කරු නීති රීති හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ දැනුම.

ඈ) ඉහළ සන්නිවේදන හා අන්තර්පුද්ගල හැකියාවක් සමඟ ඉංග්‍රීසි භාෂාව මානාව හැසිරවීම හා සිංහල/ දමිළ භාෂා පිළිබඳ දැනුම අත්‍යවශ්‍යවේ.

ඉහත සඳහන් මූලික සුදුසුකම් හා පළපුරුද්ද සතුවේ නම් දැනටමත් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ රැකියා නියුතු සේවකයින්ද මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

**වැටුප - JM-1-1 රු. 42,600-10X 755 - 18X1,135 = රු.70,580**

- රජය අනුමත සියලු දීමනා හා ජීවන වියදම් දීමනා ගෙවනු ලැබේ.

**වයස :**

අදාල රජ්‍ය චක්‍රලේඛ අනුව තීරණය වේ.

**සියලු අයදුම්කරුවන් :**

- ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
- තනතුරට පැවරෙන රාජකාරී නිසිලෙස ඉටුකිරීමට අවශ්‍ය ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
- මනා චරිතයකින් සමන්විත විය යුතුය.

**තනතුරට අදාළ සාමාන්‍ය කොන්දේසි**

- මෙම තනතුර ස්ථිරය
- තෝරාගත් අයදුම්කරු සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට හිමිකම් කියනු ලබයි.
- රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් අයදුම්පත් යොමුකළ යුතුය.
- අයදුම්කරු පිළිබඳ වර්ථා ලබාගත හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් අයදුම්පත් සමඟ ඉදිරිපත් කළ යුතුය.
- අධ්‍යාපන සහතික හා අනෙකුත් සුදුසුකම් හා පළපුරුද්ද සම්බන්ධ සහතිකවල ඡායා පිටපත් අයදුම්පත් සමඟ අමුණා ඉදිරිපත් කළ යුතුය.
- අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන විට අයදුම්කරුවන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

**රැකියාව පිළිබඳ විස්තර :**

ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරිගේ මගපෙන්වීම යටතේ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවට අවශ්‍ය පරිපාලන ක්‍රියාකාරකම් අදාළ පරිපාලන හා කළමනාකරණ සහය හා වගකීම ලබාදිය යුතුය.

**අයදුම්පත් එවන ආකාරය :**

සුදුසුකම් සහිත අයදුම්කරුවන් විසින් අධ්‍යාපනික, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද සමග අනෙකුත් පෞද්ගලික තොරතුරු ඇතුළත් ජීව දත්ත පත් අයදුම් කරන තනතුර අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කරමින් පහත ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් හෝ ඊ-මේල් ඔස්සේ **admin@slmc.gov.lk** මගින් **2025.03.24** දිනට හෝ ඊට ප්‍රථම ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද අපැහැදිලි හා නියමිත මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් කිසිදු පූර්ව දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ලේඛකාධිකාරී,**
**ශ්‍රී ලංකා වෛද්‍ය සභාව,**
**නො. 31, නොරිස් කැනල් පාර, කොළඹ 10.**
**2025.03.09**